**මහඔය ප්‍රාදේශීය සභාව - 2023**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මහඔය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මහඔය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කළ කෘෂි නිෂ්පාදන මිලදීගැනීමේ හා විකිණීමේ මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු අතරුදවුම් මුදල රු.337,048ක් වැඩියෙන් ගිණුම් තබා තිබුණි. | LDSP(BT2&3) ව්‍යාපෘතියෙහි අතරුදවුම් මුදල් වැරදි ලෙස ගිණුම්ගත කර තිබීම ඉදිරි ගිණුම් සැකසීමේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | මුඩගල කසල අංගනයේ පිහිටි මුරකුටිය මත ජල ටැංකි ආධාරකයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළව 2024 පෙබරවාරි 12 දින ලද රු.96,251ක මුදල කර්මාන්ත ණයගැති හා කර්මාන්ත ණයහිමි යටතේ අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ව්‍යාපෘතියට අදාළ රු.96,251ක මුදල කර්මාන්ත ණය ගැති හා ණය හිමි යටතේ අඩුවෙන් ගිණුම්ගත කිරීම නිවැරදි කරන බව. | - එම - |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ලී බඩු හා සවිකිරීම් | 6,789,464 | (i) ස්ථාවර වත්කම් ලේඛන | ලී බඩු හා සවි කිරීම් ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කරමින් පවතී. කාර්යාල උකරණවල වටිනාකම දැක්වීමට සාක්ෂියක් හඳුනාගත නොහැක. පවතින මිල ගණන් යටතේ තක්සේරු කිරීමට කටයුතු කරන බව. | අදාළ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | කාර්යාල උපකරණ | 3,816,344 | (ii) අයිතම අනුව වටිනාකම දැක්වෙන උපලේඛන | | |
| (ඇ) | විශ්‍රාම වැටුප් අත්තිකාරම් - ටී.බී.ජිනදාස | 162,274 | ශේෂ සනාථ කිරීම් | මේ පිළිබඳව අවශ්‍ය ලේඛන සොයා බැලීමට අවශ්‍ය කටයුතු කර ඇති බව. | ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | වැඩිපුර ගෙවීම් - සුභ සාධක සංගමය | 15,070 | ශේෂ සනාථ කිරීම් | පිළිතුරු සපයා නොමැත. | - එම - |
| (ඉ) | කඩ කාමර තැන්පත් | 19,614 | (i) ගෙවිය යුතු පාර්ශවය සහිත උපලේඛන<br>(ii) ශේෂ සනාථ කිරීම් | ගෙවිය යුතු අගයන් පිළිබඳව පෙර ලේඛන පරීක්ෂා කර ඉදිරි ගිණුම් සැකසීමේ දී නිවැරදි කරන බව. | - එම - |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති සහ රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) 5(12) රීතිය | මුදල් හා ගබඩා කටයුතු පිළිබඳව වගකිව යුතු නිලධාරීන් වෙතින් ප්‍රමාණවත් ඇපකර තබා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) 218 රීතිය | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කරවීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී කටයුතු කරන බව. | - එම - |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති | කිසියම් විශේෂිත කාර්යයන් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවක දී රු.100,000ක | මේ වන විට අත්තිකාරම පියවා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) | උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදිය හැකි වුවත්, මහඔය ප්‍රාදේශීය සභාවේ වැඩ බලන ලේකම්වරයා වෙත සීමාව ඉක්මවා රු.162,000ක අත්තිකාරම් මුදලක් 2023 මාර්තු 26 දින ලබා දී තිබුණි. | | |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ඡේදය | වාහන ඉන්ධන දහන පරීක්ෂාව මාස 12කට වරක් හෝ කිලෝමීටර් 25,000ක දුර ධාවනය කිරීමෙන් පසුව පරීක්ෂා කළ යුතු වුවත් සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 08ක ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේ දී සිදු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.2,088,618ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.2,479,682ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2023** | | | | **2022** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| i. | වරිපනම් හා බදු | 500,000 | 364,800 | 364,800 | 12,000 | 500,000 | 430,200 | 430,200 | 12,000 |
| ii. | කුලී | 10,766,956 | 9,752,078 | 9,689,409 | 7,094,943 | 10,083,402 | 15,823,744 | 9,338,219 | 7,032,274 |
| iii. | බලපත්‍ර ගාස්තු | 350,400 | 276,845 | 276,845 | - | 350,300 | 298,442 | 298,442 | - |
| iv. | වෙනත් ආදායම් | 9,695,100 | 5,846,301 | 5,846,301 | - | 2,159,912 | 518,879 | 518,879 | - |
| | **එකතුව** | 21,312,456 | 16,240,024 | 16,177,355 | 7,106,943 | 13,093,614 | 17,071,265 | 10,585,740 | 7,044,274 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කඩ කුලී ආදායම රු.5,462,157ක් වූ අතර හිඟ කඩ කුලී නොගෙවන්නන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් හිඟ මුදල් අයකර ගැනීමේ ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පැවතුණි. | මේ වන විට පැවති හිඟ මුදල් අය කිරීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | හිඟ බදු කුලී ලේඛනය අනුව වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා කාලයක සිට අයකර ගත යුතුව පවතින රු.1,380,286ක් වටිනා හිඟ ශේෂ 11ක් අය නොවී පවතින බව නිරීක්ෂණය වූ අතර ඉන් රු.155,762ක් වටිනා හිඟ ශේෂ 09ක් අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ වන විට එම ශේෂයන් ලබා ගැනීමට කටයුතු කරන බව. | - එම - |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 20ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විට අතුරු ව්‍යවස්ථා 05ක් පමණක් පනවා තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | අතුරු ව්‍යවස්ථා පනවා කටයුතු නීත්‍යානුකූල කර ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් සභා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ 2021 වර්ෂයේ ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත මුදල රු.1,361,810ක් වන කොම්පෝස්ට් අංගනය දීර්ඝ කිරීම හා වැඩිදියුණු කිරීම් ව්‍යාපෘතියට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.188,494ක වැඩ ප්‍රමාණයක් පමණක් සම්පූර්ණ කර තිබීම හේතුවෙන් එම ව්‍යාපෘතියට අදාළව අපේක්ෂිත නිමවුම් මට්ටම ළඟා කරගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ව්‍යාපෘතියේ වැඩ අවසන් කර සභාවේ කටයුතු සඳහා යොදා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය මඟින් 2021 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ මහඔය ප්‍රාදේශීය සභාව වෙත මාර්ග 17 ක් ඉදිකිරීම සඳහා රු.34,000,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර ඉන් රු.12,000,000ක් වටිනා ව්‍යාපෘති 06ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරි ව්‍යාපෘති කටයුතු සිදු කිරීමේ දී මෙම නිමා වූ ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කරමින් අවශ්‍ය කටුයතු සිදු කිරීමට පියවර ගන්නා බව. | ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වලංගු ගිවිසුම් කාලය ඉක්මවා තිබූ කඩ කාමර 26 ක ගිවිසුම් යාවත්කාලීන කිරීමට ප්‍රාදේශීය සභාව විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දුර්වලතාවයන් මඟ හරවා ගනිමින් ඉදිරියේදී කටයුතු කරන බව. | ගිවිසුම් යාවත්කාලීන කළ යුතුය. |
| (ඈ) | 2015 වර්ෂයේ පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.33,083,469ක වියදමක් දරා නිමකළ කැකිරිහේන ප්‍රදේශයේ පිහිටි වෙළෙඳ සංකීර්ණයේ කඩකාමර 24න් පළමු මහලේ කඩකාමර 12ක් 2015 වර්ෂයේ සිටත්, දෙවන මහලේ කඩකාමර 12ක් 2017 වර්ෂයේ සිටත් කඩ හිමියන් වෙත ලබා දී තිබුණ ද 2024 මැයි 08 විගණිත දින වන විට වසර 07කට අධික කාලයක සිට එම කඩකාමර විවෘත නොකර නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මෙම කඩ කාමරවලින් අයවිය යුතු හිඟ කුලිය රු.4,126,533ක් වූ අතර හිඟ මුදල් පැහැර හරින්නන් සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය කෙරෙහි සභාව විසින් අවධානය යොමු කරන අතර ව්‍යාපෘතිය සක්‍රීය කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | කුලී පැහැර හරින්නන් හට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට හා කඩකාමර පවරාගෙන නැවත ටෙන්ඩර් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | පළාත් පාලන ආයතනවල කාන්තා මහජන නියෝජිතයන් විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා යටතේ මහඔය ප්‍රාදේශීය සභාව විසින් රු.385,000ක මුදලක් වැයකර පොල්තෙල් සිඳීමේ යන්ත්‍රයක් මිලදීගෙන කැලවින්න ප්‍රජා මණ්ඩලය වෙත ලබා දී වසරකට අධික කාලයක් ගතව තිබුණ ද අදාළ යන්ත්‍රය භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විදුලි සැපයුම් ලබා ගැනීමට අවශ්‍ය ඉල්ලුම් කර ඇත. විදුලි සැපයුම් ලැබුණු පසු අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ හැකි බව. | විදුලි සම්බන්ධතාවය කඩිනමින් ලබාගෙන යන්ත්‍රය භාවිතයට ගත යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු කඩකාමර 131කින් 2023 වර්ෂය සඳහා වලංගු නොවන පැරණි තක්සේරුවක් මත පදනම්ව කඩ කුලී අයකර තිබුණි. | මේ වන විට තක්සේරු නිලධාරී විසින් තක්සේරු කිරීමේ කටයුතු සිදු කර ඇති අතර එම වාර්තා ලැබුණු පසු එම තක්සේරුවලට අදාළව කටයුතු කරන බව. | කාලීනව තක්සේරු කර කුලී අයකළ යුතුය. |

**3.4 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | **විගණන නිරීක්ෂණ** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| | සභාව සතු අළුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ වාහන 02ක් වෙන්දේසි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් එම වාහන දිරාපත් වෙමින් පැවතුණි. | ඉදිරියේ දී වෙන්දේසියට ඉදිරිත් කරන බව. | කඩිනමින් වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණ** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.173,812,047ක් වූ ස්ථාවර වත්කම් එක් එක් අයිතම අනුව වටිනාකම හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අයිතමයන්හි වටිනාකම හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගෙන යෑමට කටයුතු කරන බව. | වටිනාකම් නිවැරදිව ඇතුළත් කර ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන පවත්වා ගත යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමි 28ක වටිනාකම හඳුනාගෙන ලේඛනගත කිරීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම සුසාන භූමි තක්සේරු කිරීමට යවා ඇති බව. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග ලෙස ලද භාණ්ඩ අයිතම 44ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම භාණ්ඩ ලැබුණද වටිනාකම් සහිත විස්තරයක් ලැබී නොමැති බව. | - එම - |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අලුත්වැඩියා කළ යුතුව පවතින වාහන හා යන්ත්‍රෝපකරණ 09ක් අලුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහන අලුත්වැඩියාව සඳහා ප්‍රතිපාදන නොමැති බව. | වාහන අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සභාව භාරයේ පවතින වාහන 06ක අයිතිය සභාවේ නමට මාරු කිරීමට විගණන දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ පිළිබඳව ඉදිරියේ දී කටයුතු කරන බව. | වාහන අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවේ තනතුරු 10ක් පුරප්පාඩුව පැවතුණි. | පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් අදාළ පත්වීම් බලධාරියා දැනුවත් කර ඉල්ලීම් කර ඇති බව. | පුරප්පාඩුව සම්පූර්ණ කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය සහ මුදල් රෙගුලාසි 133(1) ප්‍රකාරව අභ්‍යන්තර විගණනය මඟින් ආයතනික මෙහෙයුම් ක්‍රියාවලින් වැඩිදියුණු කිරීම සහ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා වූ නිර්දේශ සකස් කර ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබුණ ද එය සභාවේ සියලු කාර්යයන් ආවරණය වන පරිදි විධිමත්ව සිදුකර නොතිබුණි. | මේ වන විට අභ්‍යයන්තර විගණන ක්‍රියාවලිය විධිමක්ව සිදුවෙමින් පවතින බව. | ජාතික විගණන පනත ප්‍රකාරව ආයතනික මෙහෙයුම් ක්‍රියාවලින් වැඩිදියුණු කිරීම සහ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා වූ නිර්දේශ සකස්කර ක්‍රියාත්මක කළ යුතුය. |

### 4.2 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01–2019 දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන සහ කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන කමිටු රැස්වීම් පවත්වා නැති බව. | විගණන හා කළමනාකරණ කමිටුව සඳහා ක්‍රියා පටිපාටි ආරම්භ කිරීම සහ රැස්වීම් පැවැත්වීමට පියවර ගත යුතුය. |

### 4.3 පාරිසරික ගැටලු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහඔය ප්‍රාදේශීය සභාව මඟින් මුඩගල ප්‍රදේශයේ පවත්වාගෙන යන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනත යටතේ වලංගු පරිසර බලපත්‍රයක් මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාගත යුතු වුවත්, ප්‍රාදේශීය සභාව 2023 වර්ෂයේ දී වලංගු පරිසර බලපත්‍රයක් නොමැතිව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පවත්වාගෙන ගොස් තිබුණි. | මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර බලපත්‍ර ලබා ගැනීමට ඉල්ලීම් කර මුදල් ගෙවීමට අවශ්‍ය කටයුතු කර ඇති බව. | වලංගු පරිසර බලපත්‍රයක් ලබා ගත යුතුය. |
| (ආ) | පරිසර බලපත්‍රයේ අමතර නියම හා කොන්දේසි අංක 2.2 හා 2.3ට පටහැනිව මාසිකව ජනනය වන ටොන් 21ක පමණ නොදිරන කසල විවෘත භූමියේ බැහැර කර තිබුණු අතර ඒ තුළින් දැඩි පරිසර හානියක් සිදුවන බැවින් නොදිරන කසල බැහැර කිරීමේ විධිමත් වැඩපිළිවෙලක් කෙරෙහි | මේ වන විට අප ප්‍රාදේශීය සභාවේ සේවක මණ්ඩලයේ හිඟයක් පවතින බැවින් කසල කළමනාකරණ ව්‍යාපෘතිය යාවත්කාලීන කිරීමට හැකියාවක් නොමැති බව. | නොදිරන කසල ප්‍රතිචක්‍රීකරණ වැඩපිළිවෙලක් කෙරෙහි අවධානය යොමුවිය යුතුය. |

සභාවේ කඩිනම් අවධානය යොමුවිය යුතුව පැවතුණි.

## 4.4 තිරසාර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු හා පරමාර්ථ ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස්කර ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැලසීමට සභාව විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අයවැය සැකසීමේදී තිරසර සංවර්ධන ඉලක්ක අරමුණු කර ගනිමින් කටයුතු කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන පරමාර්ථ සහ අරමුණු ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස්කර ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැලැසීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුය. |